දරුවන් උදෙසා
බයිබලයක්



# නෝවා සහ මහත් ජලගැල්ම

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Byron Unger; Lazarus Alastair Paterson

සකස්කරන්නා: M. Maillot; Tammy S.

අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2020 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.


නෝවා දෙවියන් වහන්සේට නමස්කාර
කළ මනුෂ්‍යයෙක්. අන් සියලු දෙනා
දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කොට
දෙවියන් වහන්සේට අකිකරු වුණා.
එක් දවසක්, විශ්වාස කිරීමට පවා
නොහැකි දෙයක් දෙවියන් වහන්සේ
නෝවාට වදාළ සේක.
එනම්,
’’මම මේ
නපුරු ලෝකය
විනාශ කිරීමට
යනවා, ඔබේ
පවුල පමණක්
ඉන් බේරේවි.’’

දෙවියන් වහන්සේ නෝවාට අනතුරු ඇඟවමින්
පැවසුවේ මහා ජලගැල්මක් විත් මුළු ලොවම
වසාගන්නා බවයි. ඔබේ පවුලට හා බොහෝ
සතුන්ට සිටීමට හැකි විශාල ලී නැවක්
හදන්නැයි නෝවාට නියම කළ සේක.
දෙවියන් වහන්සේ නෝවාට පැහැදිලි
උපදෙස් ලබා දුන්
සේක. නෝවා
ද ඉතා
කාර්ය
බහුල
විය.





නෝවා නැවක් සාදන්නේ
ඇයිදැයි විස්තර කරදෙන
විට එය අසා සිටි මිනිසුන්
නෝවාට සමච්චල්
කළා. නමුත්
නෝවා

දිගටම
නැව සැදුවා.
ඒ අතරතුර
දෙවියන් වහන්සේ
පිළිබඳව ජනතාවට පැවසුවා.
නමුත් කවුරුත් ඔහුට සවන්
දුන්නේ නැහැ.



නෝවාට ඉතා විශාල
ඇදහිල්ලක් තිබුණා. මීට පෙර
කිසි දිනක වත් දැක නොමැති
වුණත් නෝවා දෙවියන් වහන්සේ
විශ්වාස කළා. ඉක්මණින්ම
නැවට අවශ්‍ය සෑම දෙයක්ම
එහි තැන්පත් කළා.

ඉන්පසුව සතුන් නැව ඇතුළට දැම්මා. දෙවියන් වහන්සේ සමහර සතුන් වර්ගවලින් සත් දෙනා බැගින් ද අනෙකුත් සතුන් අතරින් දෙදෙනා බැගින් ද ඇතුළු කරන්නට අණ කළ සේක. මහා විශාල සතුන් මෙන්ම කුඩා සතුන් ද විශාල පක්ෂීන් මෙන්ම පුංචි කුරුල්ලන් ද




නෝවා සතුන් නැවට තුළට රැගෙන එනවිට
මිනිසුන් නෝවාට අපහාස කරන්න
ඇති. ඔවුන් දෙවියන් වහන්සේට
විරුද්ධව පවු කිරීම නතර කළේ
නැහැ. ඔවුන්ට නැව තුළට
යාමට අවසර ඉල්ලුවේ
නැහැ.



අවසානයේ සෑම වර්ගයකම සතුන් හා කුරුල්ලන් නැවට ඇතුළු වියඡ්

''දැන් ඔබ ඔබේ පවුලත් සමඟ නැවට ඇතුළු වන්න'' යැයි දෙවියන් වහන්සේ නෝවාට ආරාධනා කළ සේක. නෝවා, ඔහුගේ භාර්යාව, ඔහුගේ දරුවන් තිදෙනා සහ ඔවුන්ගේ භාර්යාවන් නැවට ඇතුළු විය. එවිට දෙවියන් වහන්සේ නැවේ දොර වැසූ සේක.



ඉන්පසු වැස්ස
පටන්ගත්තා. මහා ලොකු
වර්ෂාවක් දින හතළිහක්
පුරා දවාලේත් රාත්‍රියේත්
එක දිගට පොළොව මත
වැටුණා.



ජලගැල්ම සියලු නගර හා ගම්වලට
පැතිර ගියා. වැස්ස නතර වූ
පසුව කඳු පවා යටවී තිබුණා.



ජලගැල්ම ඉහළ යාමත් සමඟ නැව කඳු මුදුනක නතර වුණා. සමහර විට නැව ඇතුළත අන්ධකාරව හා ගැස්සීම් සහිතව ඉතා භයානකව පවතින්නට ඇති. ජලගැල්මෙන් නොවා රැකගනු ලැබුවා.


මාස පහක ජලගැල්මෙන් පසු දෙවියන්
වහන්සේ විසින් වියළි සුළඟක් එවනු
ලැබුවා. නැව අරරත් කන්ද මත නතර
විය. ජලය බැස යනතෙක් තවත් දින
සතළිසක් නෝවාට නැව තුළ
සිටීමට සිදුවිය.

නෝවා නැවේ කවුළුවක් හැර කපුටකු සහ පරවියකු පිටතට යැවීය. එහෙත් පරවියාට රැඳී සිටීමට පිරිසිදු වියළි තැනක් නොතිබූ බැවින් නැවත හැරී නැවට පියාඹා ආවේය.





සත්
දවසකට
පසු නැවතත් පරවියා නැවෙන්
පිටතට හැරියේය. පරවියා ආපසු
නෝවා වෙතට ආවේ අමු ඔලීව
දළුවක් හොටෙන් රැගෙන යඤ
නොවා තව සත් දවසක් බලා සිට
පරවියා පිටතට හැරියේය. ඌ නැවත
හැරී නාවේය. ජලය පොළව මතුපිටින්
සිඳී ගොස් තිබූ බව නෝවාට
තහවුරු විය.

සියලු ආකාර සත්ත්වයන්, පක්ෂීන් හා නෝවාගේ
පවුලේ සියලු දෙනාට ද නැවෙන් පිටතට එන
ලෙස දෙවියන් වහන්සේ වදාළ සේක.



භයානක ජලගැල්මෙන් ඔහු සහ
ඔහුගේ පවුලේ සියලු දෙනා බේරා
ගැනිම උදෙසා, පූජාසනයක
ගොඩනඟා නෝවා දෙවියන්
වහන්සේට නමස්කාර කළේය.



නෝවා තුළ කෙතරම්
මහත් කළගුණ දැක්වීමක්
ඇතිවන්ට ඇත් ද?



දෙවියන් වහන්සේ
නෝවාට අනඟි
පොරොන්දුවක් දුන්
සේක. එනම් මින්මතු
මිනිසාගේ පාපය විනිශ්චය
කරමින් ජලගැල්මකින් ලොවට

පහර නොදෙන බව ය.
දෙවියන් වහන්සේ මෙම
අනඟි පොරොන්දුව
සඳහා සිහිවීමේ ලකුණක්
දුන් සේක. දේදුන්න එම
පොරොන්දුවේ ලකුණ විය.



ජලගැල්මෙන් පසු
නෝවා සහ පවුල
අලුත් ආරම්භයකට යොමු වුණා.
කල්ගත වෙත්ම නෝවාගෙන් පැවත
ආ අය මුළු පොළොව පුරා පැතිර
ගියා. ලෝකයේ සියලු ජාතීන්
නෝවා සහ
ඔහුගේ

පුතුන්ගෙන්
පැවත එන්නන් විය.

නෝවා සහ මහත් ජලගැල්ම

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

උත්පත්ති 6-10

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)